මෙම පරිවර්තන පත්‍රිකාව පාවිච්චි කරන්නේ කෙසේද?

- පහත සාම්පලයේ ඇති තොරතුරු කියවන්න
- ඉංග්‍රීසියෙන් ඇති රටට පැමිණෙන මගීන් සඳහාවූ කාඩ්පතක අදාල කොටු පුරවන්න

මෙම පත්‍රිකාවේ කිසිවක් ලියන්න එපා (සාම්පලයක් පමණි)

රටට පැමිණෙන මගීන් සඳහාවූ කාඩ්පත • ඕස්ට්‍රේලියාව

කරුණාකර නිල් හෝ කළු පැනක් භාවිතාකර ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කරන්න

- පවුල් නම/වාසගම
- දෙනලද නම්
- ගමන් බලපත්‍ර අංකය
- ගුවන් යානා අංකය හෝ නැවෙහි නම
- ඕස්ට්‍රේලියාවේ සිටීමට බලාපොරොත්තුවන ලිපිනය

ප්‍රාන්තය

- ඔබ මීළඟ මාස 12 ඇතුලත ඕස්ට්‍රේලියාවේ ජීවත්වීමට බලාපොරොත්තු වන්නේද? ඔව් නැත
- ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නොවේනම්:
  - ඔබට ක්ෂය රෝගය තිබේද? ඔව් නැත
  - ඔබව කිසියම් අපරාධ වරදකට/වැරදිවලට වැරදිකරු කර තිබේද? ඔව් නැත

කරුණාකර ✕ සළකුණුකර සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න - පිළිතුර කුමක්ද යන්න අවිනිශ්චිත නම්, ඔව් යන්න ✕ යොදා සළකුණු කරන්න

- ඔබ පහතදේ ඕස්ට්‍රේලියාවට රැගෙන එන්නේද:

1. බෙහෙත්, ස්ටෙරොයිඩ්, නීතිවිරෝධී අශ්ලීල දේ (pornography), ගිනි අවි, අවි ආයුධ හෝ නීති විරෝධී මත් ද්‍රව්‍ය වැනි තහනම් හෝ සීමාවලට යටත් භාණ්ඩ? ඔව් නැත
2. මිලී 2250 කට වැඩි මධ්‍යසාර පානයන් හෝ දුම්වැටි 25ක් හෝ ග 25කට වැඩි දුම්කොළ නිෂ්පාදන? ඔව් නැත
3. තෑග ඇතුළුව සම්පූර්ණ මුළු මුදල AUD$900 කට වඩා විදේශයකදී ලබාගත් භාණ්ඩ හෝ බදු සහිතව සහ/හෝ බදු රහිතව ඕස්ට්‍රේලියාවේදී මිළට ගත් භාණ්ඩ? ඔව් නැත
4. ව්‍යාපාර/වාණිජ භාවිතය සඳහාවූ භාණ්ඩ/සාම්පල? ඔව් නැත
5. AUD$10,000 හෝ ඊට වැඩි ප්‍රමාණයක ඕස්ට්‍රේලියානු හෝ විදේශ මුදල් ඔව් නැත

   සටහන: රේගු හෝ පොලිස් නිලධාරියෙකු විසින් විමසුවහොත් ඔබ විසින් ඕනෑම වටිනාකමකවූ සංචාරක චෙක්පත් (travellers cheques), චෙක්පත් (cheques), මුදල් ඇණවුම් (money orders) හෝ දරණ අයහට ගනුදෙනුකල හැකි වෙනත් සාධන පත්‍ර (bearer negotiable instruments) වාර්තා කල යුතුවේ.

6. මස්, කුකුළු මස්, මාළු, මුහුදු මාළු, බිත්තර, ගව නිෂ්පාදන, පළතුරු, එළවළු? ඔව් නැත
7. ධාන්‍ය වර්ග, ඇට වර්ග, අල වර්ග, පිදුරු, ඟාබ කොටස්, සාම්ප්‍රදායික බෙහෙත් හෝ පැළෑටි, දැව භාණ්ඩ? ඔව් නැත
8. සතුන්, සතුන්ගේ කොටස්, සුරතලයට ඇතිකරන සතුන් සඳහාවූ ආහාර, බිත්තර, පෙව විද්‍යාත්මකදේ, නිදර්ශක, කුරුල්ලන්, මාළු, කෘමීන්, සිප්පි, මීමැසි නිෂ්පාදන ඇතුළු සත්ව නිෂ්පාදන? ඔව් නැත
9. පස්, පස් තැවරුණු දේවල් හෝ මිරිදිය ප්‍රදේශවල භාවිතා කල දේවල් උදා. ක්‍රීඩා/විනෝද උපකරණ, සපත්තු? ඔව් නැත
10. ඔබ පසුගිය දින 30 ඇතුලත ගොවිපළ, ගොවිපළ සතුන්, වනාන්තර ප්‍රදේශ හෝ මිරිදිය දියපහරවල්/විල් ආදිය සමඟ සම්බන්ධ වුණිද? ඔව් නැත
11. ඔබ පසුගිය දින 6 ඇතුලත අප්‍රිකාව, දකුණු/මධ්‍යම ඇමෙරිකාව හෝ කැරිබියන් ප්‍රදේශවල සිටියේද? ඔව් නැත

ප්‍රකාශනය

මම විසින් සපයන ලද තොරතුරු සත්‍යය, නිවැරදි සහ සම්පූර්ණවේ. කිසියම් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට අපොහොසත්වීම මගින් දරුණු ප්‍රතිවිපාක ඇතිවන බවට මම අවබෝධ කරගෙන සිටිමි.

ඔබගේ අත්සන

දිනය මාසය වසර

කාඩ්පත පිටුපසට හරවන්න

Sinhalese

SAMPLE

ඕස්ට්‍රේලියාව තුල ඔබ හා සම්බන්ධවීමේ තොරතුරු

දුරකථනය ( )

ඊමේල්

හෝ

ලිපිනය

ප්‍රාන්තය

හදිසි අවස්ථාවකදී සම්බන්ධවීම සඳහා තොරතුරු (පවුලේ අයෙකු හෝ මිතුරෙකු)

නම

ඊමේල්

දුරකථනය හෝ

තැපැල් ලිපිනය

කරුණාකර ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කරන්න

▶ ඔබ මෙම ගුවන් යානාවට හෝ නැවට නැග්ගේ කුමන රටින්ද?

◆ ඔබගේ සාමාන්‍ය වෑත්තීය කුමක්ද?

▶ ගමන් බලපත්‍රයේ ඇති ආකාරයට ජාතිකත්වය

▶ උපන් දිනය දිනය මාසය වසර

▶ **කරුණාකර A හෝ B හෝ C ඉදිරියෙන් ✕ සළකුණ යොදා පිළිතුරු දෙන්න**

A **ඕස්ට්‍රේලියාවට ස්ථිර වශයෙන් සංක්‍රමණය කිරීම**

මෙම කාඩ්පතෙහි දෙපැත්තම සම්පූර්ණ කර ඇති බවට වග බලා ගන්න. ඔබ රටට පැමිණි විට ඔබගේ ගමන් බලපත්‍රය සමඟ මෙම කාඩ්පත ඉදිරිපත් කරන්න.

B **සංචාරකයෙකු හෝ තාවකාලික වශයෙන් රටට ඇතුළුවන්නෙකු**

වසර මාස දින

▶ ඔබ ඕස්ට්‍රේලියාවේ සිටීමට බලාපොරොත්තුවන කාලය හෝ

▶ ඔබ පදිංචි රට

C **නේවාසිකයන් නැවත ඕස්ට්‍රේලියාවට පැමිණීම**

▶ විදේශගතවී සිටින විට වැඩිපුරම කාලය ගතකල රට

▶ ඔබට ගමන් කිරීමට ඇති ප්‍රධාන හේතුව (එකකට පමණක් X යොදා සළකුණු කරන්න)

සම්මන්ත්‍රණ/සම්මේලන 1 | මිතුරන් හෝ නැයින් සංචාරය කිරීම 3 | අධ්‍යාපනය 5 | නිවාඩු 7

ව්‍යාපාර 2 | රැකියා 4 | ප්‍රදර්ශනය 6 | වෙනත 8

මෙම පෝරමයේ ඉල්ලා ඇති තොරතුරු සංක්‍රමණ, රෙගු, නිරෝධායන, සංඛ්‍යාලේඛණ, සෞඛ්‍යය, වන සත්ව ජීවිතය සහ ඕස්ට්‍රේලියාවේ මුදල් නීති පරිපාලනය කිරීමට අවශ්‍යවන අතර මෙම තොරතුරු රැස්කිරීම සඳහා නීතිය මඟින් අනුමැතිය ලබාදී ඇත. මෙම තොරතුරු හෙළිදරව් කරනුයේ මෙම නීති ක්ෂේත්‍රයන් පරිපාලනය කරන සහ ඕස්ට්‍රේලියානු නීතිය යටතේ එවා ලබාදීමට සහ ලබා ගැනීමට අවශ්‍ය ඵජන්සිවලට පමණක්වේ. වෙතින් *Privacy notice* (පුද්ගලිකතා දැන්වීම) ආකෘති 1442i ලබාගත හැකිය.

07191503

© Commonwealth of Australia 2019

15 SIN (Design date 07/19)

SAMPLE